# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2387/25 - 2024 ජූනි මස 05 වැනි බදාදා - 2024.06.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සමිති ආඥාපනත

සමිති ආඥාපනතේ (123 අධිකාරය) 3 වන හා 4 වන වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර කර්මාන්ත අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ වන මම මේ නිවේදනයෙන් ;

01. ගිරාදුරුකෝට්ටේ, අගලඹය, පන්සල පාර, අංක 03 දරන ස්ථානයේ පිහිටි ''දුරස්ථ අධ්‍යාපන සභාව'' නමැති සමිතිය ආරම්භ කරනු ලැබූ පරමාර්ථයන් ඒ ආඥාපනතෙහි බලතල හා පහසුකම් ව්‍යාප්ත කළ යුතු පරමාර්ථයන් වශයෙන් නියම කරමි ; සහ

02. ඒ ආඥාපනතෙහි 5(4) වගන්තියේ විධිවිධානවලින් නිදහස් කිරීමෙන් ඒ ආඥාපනත අදාළ කිරීම එකී සමිතියට සීමා කරමි.

වෛද්‍ය **රමේෂ් පතිරණ,**
කර්මාන්ත අමාත්‍ය.

2024 ක් වූ මැයි මස 22 වැනි දින,
කර්මාන්ත අමාත්‍යාංශය,
අංක 73/1,
ගාලු පාර,
කොළඹ 03.

EOG 06-0026

**සමිති ආඥාපනත**

සමිති ආඥාපනතේ (123 අධිකාරය) 3 වන හා 4 වන වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර කර්මාන්ත අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ වන මම මේ නිවේදනයෙන් ;

01. ලුණුවිල, සී. ආර්. අයි. පාර, පළුගහ වත්ත, අංක 01 දරන ස්ථානයේ පිහිටි ''සිලෝන් කොයා(ර්) ෆයිබ(ර්) මැනුෆැක්ච(ර්)රස් අසෝසියේෂන්'' නමැති සමිතිය ආරම්භ කරනු ලැබූ පරමාර්ථයන් ඒ ආඥාපනතෙහි බලතල හා පහසුකම් ව්‍යාප්ත කළ යුතු පරමාර්ථයන් වශයෙන් නියම කරමි ; සහ

02. ඒ ආඥාපනතෙහි 5(4) වගන්තියේ විධිවිධානවලින් නිදහස් කිරීමෙන් ඒ ආඥාපනත අදාළ කිරීම එකී සමිතියට සීමා කරමි.

වෛද්‍ය **රමේෂ් පතිරණ,**
කර්මාන්ත අමාත්‍ය.

2024 ක් වූ මැයි මස 22 වැනි දින,
කර්මාන්ත අමාත්‍යාංශය,
අංක 73/1,
ගාලු පාර,
කොළඹ 03.

EOG 06-0027

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.